25-09-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, සියලුම මනුෂ්‍යයන් සහ පදාර්ථ පරිවර්ථනය වන, එක් විශ්වවිද්‍යාලයක් පමණයි තිබෙන්නේ. සෑම කෙනෙකුටම විමුක්තිය ලැබෙන්නේ මෙහිදීය.

**ප්‍රශ්නය:** ඔබට පියා කෙරෙහි විශ්වාසය ඇති වූ වහාම, ඔබ සැනෙකින් ක්‍රියාත්මක කළ යුත්තේ කුමන අවවාදයද?

**පිළිතුර:** පියා පැමිණ ඇති බවට ඔබ තුළ විශ්වාසයක් ඇති වූ විට, ඔබ සැනෙකින් ක්‍රියාත්මක කළ යුත්තේ පියා ඔබට ලබා දෙන පළමු අවවාදයයි: 1) ඔබගේ දෑසින් දකින සෑම දෙයක්ම අමතක කර දමන්න. මගේ උපදෙස් පමණක් පිළිපදින්න. 2) ඔබ පියාට අයත් වූ පසු, ඔබගේ ගනුදෙනු, අපවිත්‍ර ජීව සමඟ නොවිය යුතුයි. බුද්ධියේ විශ්වාසය ඇති දරුවන්ට කිසිම දෙයක් ගැන සැක ඇති විය නොහැක.

ඕම් ශාන්ති. මෙය නිවහනක් මෙන්ම විශ්වවිද්‍යාලයකි. මුළු ලෝකයේම මනුෂ්‍යයන්ට මෙහිදී විමුක්තිය ලැබෙන බැවින්, මෙයට දෙවි පියාණන්ගේ ලෝක විශ්වවිද්‍යාලය යැයි කියයි. එසේනම් මෙය සැබෑ ලෝක විශ්වවිද්‍යාලයක් මෙන්ම එය නිවහනක්ද වෙයි. ඔබ මව සහ පියා ඉදිරියේ අසුන්ගෙන සිටින අතර මෙය විශ්වවිද්‍යාලයක්ද වෙයි. ආධ්‍යාත්මික පියා මෙහි අසුන් ගෙන සිටිනවා. මෙය, ඔබට ආධ්‍යාත්මික පියාගෙන් ලැබෙන ආධ්‍යාත්මික දැනුමයි. මෙම ආධ්‍යාත්මික දැනුම ලබා දිය හැක්කේ ආධ්‍යාත්මික පියාට පමණයි, කිසිම මනුෂ්‍යයෙකුට නොවෙයි. දැනුමේ මහා සාගරය යැයි ඔබ කියන්නේ ඔහුට වන අතර, ඔබට විමුක්තිය ලැබෙන්නේ දැනුම තුළින්ය. දැනුමේ මහා සාගරය, සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා, ඒකායන පියා පමණක් වන්නේ මේ නිසාය. විශ්වයේ මනුෂ්‍යයන් පමණක් නොවෙයි, සෑම දෙයක්ම, පංච මහාභූතයන්ද, පියාගේ මාර්ගයෙන් සතෝප්‍රධාන් වෙයි සෑම කෙනෙකුටම විමුක්තිය ලැබෙයි. මෙම කරුණු ඉතා හොඳින් වටහා ගත යුතුයි. දැන් සෑම කෙනෙකුටම විමුක්තිය ලැබීමට තිබේ. පැරණි ලෝකය සහ ලෝකයේ ජීවත් වන සියලුම මනුෂ්‍යයන් පරිවර්ථනය වෙයි. ඔබ දකින සෑම දෙයක්ම පරිවර්ථනය වී අළුත් වෙයි. මෙසේ ගායනා කරයි මෙහි ඔබට බොරුවක් වන මායා සහ බොරුවක් වන සිරුරක් තිබේ. මෙය අසත්‍ය දේශය බවට පත් වී තිබේ. භාරතය, සත්‍ය දේශය වූ අතර එය දැන් අසත්‍ය දේශය වී ඇත. නිර්මාණකරු සහ නිර්මාණය ගැන මිනිසුන් පවසන සෑම දෙයක්ම අසත්‍යයි. ඔබට දැන් පියාගෙන් සෑම දෙයක් ගැනම දැන ගන්නට ලැබී තිබේ. පරමාත්ම දෙවියන් පවසයි දෙවියන් වන්නේ ඒකායන පියා පමණයි. ඔහු අශාරීරිකයි. ඇත්ත වශයෙන්ම සෑම ජීවාත්මයක්ම අශාරීරික වන අතර ඔවුන් ඉන්පසුව මෙහිදී ශාරීරික ස්වරූප ගනී. එහිදී ස්වරූපයක් නැත. ජීවාත්ම, අශාරීරික ලෝකයේ, බ්‍රහ්ම පදාර්ථයේ වාසය කරයි. එය, ජීවාත්ම වන අපගේ නිවහනයි, බ්‍රහ්ම, යන මහා භූතයයි. මෙය, ආකාශ මහා භූතයයි, එයට යටින්, ශාරීරික චරිත කොටස් රඟ දැක්වෙයි. ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය නැවත නැවතත් ඒ අයුරින්ම සිදුවෙයි. ඔවුන්ට මෙහි අරුත වැටහෙන්නේ නැත. එය නැවත සිදුවන බව ඔවුන් පවසයි, ස්වර්ණමය යුගය, රිදී යුගය... ඉන්පසුව කුමක්ද? ස්වර්ණමය යුගය, ඉන්පසුව නියත වශයෙන්ම පැමිණෙයි. තිබෙන්නේ එක් සංගම යුගයක් පමණයි. ස්වර්ණමය යුගය සහ රිදී යුගය අතර සහ රිදී යුගය සහ තඹ යුගය අතර සංගමය, සංගමය නොවෙයි එය වැරදියි. පියා පවසන්නේ මා සෑම චක්‍රයකම සංගම යුගයේ පැමිණෙන්නෙමි. ඔබ මට අඬ ගසන්නේ ඔබ අපවිත්‍ර වූ විට පමණයි. ඔබ පවසන්නේ 'පැමිණ, අපව පිවිතුරු කරන්න!' ඔබ පිවිතුරු වන්නේ ස්වර්ණමය යුගයේදී පමණයි. මෙය දැන් සංගමයයි. එයට යහපත ගෙනෙන සංගම යුගය යැයි කියයි. මෙය සංගමයයි, ජීවාත්ම, පරම ජීවාත්මය සමඟ හමුවයි. මෙයට කුම්භ (හමුව) යැයි කියයි. එවිට ඔවුන් ගංගා අතර හමුවක් පෙන්වයි. ගංගා දෙකක් තිබෙන අතර තුන්වැන්න අදෘෂ්‍යමාන බව ඔවුන් පවසයි. එයද අසත්‍යයකි. අදෘෂ්‍යමාන ගංගාවක් තිබෙන්නේ කෙසේද? අදෘෂ්‍යමාන ගඟක් තිබිය හැකි බව, විද්‍යාඥයින්ද විශ්වාස නොකරයි. ඊතලයක් විද, ගංගා නදිය මතු වූ බව ඔවුන් පවසන නමුත් ඒ සියල්ල අසත්‍යයකි. දැනුම, භක්තිය සහ නිරාශාව තිබෙන බව සිහි කෙරෙයි. ඔවුන් එම වදන් අල්ලාගන්න නමුත්, එහි අරුත ඔවුන්ට වැටහෙන්නේ නැත. ප්‍රථමයෙන් දැනුම තිබේ - දිවාකල, සතුට - ඉන්පසුව, භක්තිය - රාත්‍රිය, දුක. බ්‍රහ්මගේ දිවාකල සහ බ්‍රහ්මගේ රාත්‍රිය තිබේ. එය එක් අයෙකුගේ පමණක් විය නොහැක ඔවුන් බොහෝ දෙනෙක් සිටිය යුතුයි. දිවාකල චක්‍රයෙන් භාගයක් තිබෙන අතර රාත්‍රිය චක්‍රයෙන් භාගයක් තිබෙයි. ඉන්පසුව මුළු පැරණි ලෝකය පිළිබඳවම නිරාශාවක් තිබේ. ඔබගේ ව්‍යාපාරික කටයුතු ආදිය ඔබ කළ යුතු අතර, ඔබගේ දරුවන්ද රැක බලා ගත යුතුයි, නමුත් ඔබගේ බුද්ධියේ

යෝගාව, එක් අයට සම්බන්ධ වී තිබිය යුතුයි. ඔබ චක්‍රයෙන් භාගයක් රාවණගේ උපදෙස් පිළිපදිමින් සිටියා. ඔබ දැන් අයත් වන්නේ පියාටයි, එබැවින් ඔබ කුමක් කළත්, එය පියාගේ අවවාද වලට අනුව කරන්න. ඒ සෑම කල්හිම, ඔබගේ ගනුදෙනු සිදුවූයේ අපවිත්‍ර මනුෂ්‍යයන් සමඟයි. එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද? දිනෙන් දින ඔබ අඛණ්ඩව අපවිත්‍ර වූවා, මන්ද භක්ති මාර්ගය, පහළට පැමිණීමට ඇති මාර්ගයයි. ඔබ සතෝප්‍රධාන්, සතෝ, රජෝ සහ තමෝ යන තත්ත්ව තුළින් යා යුතුයි. ඔබ නියත වශයෙන්ම පහළට පැමිණිය යුතුයි කිසි කෙනෙකුට ඔබව ඉන් මුදවා ගත නොහැක. ලක්ෂ්මි සහ නාරායනගේ උපත් 84 පෙන්වා තිබේ. ඉංග්‍රීසියෙන් ඇති වචන ඉතා හොඳයි. ස්වර්ණමය යුගය... ඉන්පසුව එයට වෙනත් ලෝහ මිශ්‍ර වෙයි. ඔබ දැන් කලි යුගී වී ඇත. ස්වර්ණමය යුගයේ නව ලෝකය, නව භාරතයක් විය. ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානිය විය එය ඊයේ සිදුවූ දෙයක් වැනිය. ඔවුන් ග්‍රන්ථ වල ලියා ඇත්තේ එය වසර සිය දහස් ගණනක කාරණාවක් බවයි. පියා දැන් පවසන්නේ නිවැරදි වන්නේ, ඔබගේ ග්‍රන්ථද, මමද? පියාට ලෝක සර්ව බලධාරියා යැයි කියයි. බොහෝ වේද සහ ග්‍රන්ථ හදාරන අයට, බලධාරීන් යැයි කියයි. පියා පවසන්නේ ඔවුන් සියල්ල භක්ති මාර්ගයේ බලධාරීන්ය. දැනුමට අනුව, මගේ ප්‍රශංසාව වන්නේ දැනුමේ මහා සාගරය ඔබයි. අප එය නොවෙයි. සියලුම මනුෂ්‍යයන් භක්ති සාගරයේ ගිලෙමින් සිටියි. ස්වර්ණමය යුගයේ කිසිම කෙනෙක් පාපයේ ගැලෙන්නේ නැත. කලි යුගයේ මනුෂ්‍යයන්, එහි ආරම්භයේ සිට මැද හරහා අවසානය තෙක් දුකින් සිටියි. පියා පෙර චක්‍රයේද මේ ආකාරයෙන් විස්තර කළා. ඔහු දැන් නැවත වරක් ඔබට විස්තර කරයි. පෙර චක්‍රයේද අසීමිත පියාගෙන් ඔබගේ උරුමය හිමි කරගත් බව ඔය දරුවන්ට වැටහෙයි. ඔබ දැන් ඉගෙනගෙන එය නැවත වරක් හිමි කරගන්නවා. දැන් ඉතිරිව ඇති කාලය ඉතාමත් කෙටිය. මෙම ලෝකය විනාශ වීමට තිබේ. ඔබ අසීමිත පියාගෙන් ඔබගේ සම්පූර්ණ උරුමයම හිමි කරගත යුත්තේ මේ නිසාය. පියා, ගුරුවරයා මෙන්ම ගුරුද වෙයි. ඔබ පරම පියා මෙන්ම පරම ගුරුවරයාද වෙයි. ලෝකයේ ඉතිහාසය සහ භූගෝලය ඒ අයුරින්ම නැවත නැවතත් සිදු වන ආකාරය පිළිබඳ සම්පූර්ණ දැනුම ඔහු ලබා දෙයි. වෙනත් කිසිවෙකුට මෙය විස්තර කළ නොහැක. මේ, වසර 5000කට පෙර පැමිණි එම ගීතාවේ දෙවියන්ම බව, ඔය දරුවන්ට වැටහෙයි. මනුෂ්‍යයන්ට දෙවියන් යයි ඇමතිය නොහැක. පරමාත්ම දෙවියන් පුනර්භව ගැනීම ඉක්මවා සිටියි. ඔහුගේ උපත, දිව්‍යමය බව කියයි. අශාරීරික කෙනා වන මා, එසේ නැත්නම් කතා කරන්නේ කෙසේද? මා නියත වශයෙන්ම පැමිණ, ඔබව පිවිතුරු කළ යුතුයි, එබැවින් මා ඔබට මාර්ගය පෙන්විය යුතුයි. ඔබ අමරණීය බව, ඔය ජීවාත්ම දන්නවා. රාවණගේ රාජධානියේ ඔබ සියලු දෙනාම ශරීර අවධානයට පත් වී ඇත. ස්වර්ණමය යුගයේදී ඔබ සිටින්නේ ජීව අවධානයෙනි. එහිද, කිසිම කෙනෙක් නිර්මාණකරු වන පරම පියාව හෝ ඔහුගේ නිර්මාණය නොදනී. ඔවුන් නැවතත් පහළට පැමිණිය යුතුය, යන අවධානය ඔවුන්ට තිබුණේ නම්, ඔවුන්ට රාජධානියේ සතුට අත්විඳීමට නොහැකි වෙයි. මේ නිසයි පියා මෙසේ පවසන්නේ ඔබ එහි සිටින විට, මෙම දැනුම අතුරුදහන්ව තිබෙයි, මන්ද ඔබට විමුක්තිය ලැබී ඇති නිසා, කිසිම දැනුමක අවශ්‍යතාවයක් නොමැත. දැනුම අවශ්‍ය වන්නේ ඔබ පහත් වූ විටයි. මෙකල සෑම කෙනෙක්ම පහත්ය. රාග කොතේ අසුන් ගැනීමෙන් සෑම කෙනෙක්ම පිළිස්සී ඇත. පියා පවසන්නේ මගේ දරුවන්, පැමිණ, ඔවුන්ගේ ශරීර තුළින් චරිත රඟපාන ජීවාත්ම, රාග කොතෙහි අසුන් ගැනීමෙන් තමෝප්‍රධාන් වී ඇත. ඔබ කන්නලව් කරන්නේ අප අපවිත්‍ර වී සිටියි. ඔබ අපවිත්‍ර වන්නේ රාග කොත මගින්ය. කෝපය හෝ තන්හාව නිසා ඔබ අපවිත්‍ර වන්නේ නැත. තාපසයන් සහ පූජකයන් ආදීන් පිවිතුරුයි. දේවතාවන් පාරිශුද්ධයි, එබැවින් මනුෂ්‍යයන් ගොස් ඔවුන් ඉදිරියේ හිස නමති. ඔවුන් ගායනා කරන්නේ ඔබ දූෂිත බවින් තොර වන අතර අප දූෂිතයි. දූෂණයෙන් තොර ලෝකය සහ දූෂිත ලෝකය සිහි කර තිබේ. භාරතය දූෂණයෙන් තොර ලෝකය වූ නමුත් එය දැන් දූෂිතයි. භාරතය ඇතුළුව මුළු ලෝකයම දූෂිතයි. වසර 5000කට පෙරාතුව, දූෂණයෙන් තොර ලෝකයේ, තිබුණේ එක් ධර්මයක් පමණයි. පාරිශුද්ධත්වය තිබුණා, එබැවින් සාමය සහ සමෘද්ධියද තිබුණි තුනම තිබුණි. පළමුවැන්න පාරිශුද්ධත්වයයි. දැන් පාරිශුද්ධත්වය නොමැත, එබැවින් සාමය සහ සමෘද්ධියද නැත. දැනුමේ මහා සාගරය, සතුටේ මහා සයුර සහ සෙනෙහසේ මහා සාගරය වන්නේ ඒකායන පියා පමණයි. ඔහු ඔබවත් ඒ තරමම ආදරණීය කරවයි. ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානියේ සෑම කෙනෙක්ම ආදරණීයයි සියලුම මනුෂ්‍යයන් සහ සතුන් ආදරණීයයි. සිංහයා සහ බැටළුවා එකම ගංගාවෙන් වතුර පානය කරයි. එය නිදසුනක් පමණයි. එහි අපද්‍රව්‍ය ඇති කරන කිසිම දෙයක් නැත. මෙහි බොහෝ රෝග සහ මදුරුවන් ආදිය ඇත. එවන් දේ එහි නොපවතී. ධනවත් මිනිසුන්ට පළමු සණයේ ගෘහභාණ්ඩ ආදිය තිබෙන නමුත් දුප්පතුන්ගේ ගෘහභාණ්ඩ සාමාන්‍යයි. ස්වර්ණමය යුගයේ බොහෝ සේ පිරිසිදු බව තිබේ. පළමු සණයේ රත්තරං මාලිගා තිබෙයි. පාරාදීසියේ ගවයන් කෙතරම් ප්‍රථම සණයේද කියා බලන්න. ඔවුන් ක්‍රිෂ්ණාව බොහෝ සෙයින් ලස්සන ගවයන් සමඟ පෙන්වයි. ක්‍රිෂ්ණාගේ දේශයේ ගවයන් සිටිවි. එහි සෑම දෙයක්ම පළමු සණයේ ඒවාය. ටිකක් සිතන්න, එය

දිව්‍ය ලෝකයයි, එබැවින් කිසිම අඩුවක් නැත. මෙම පැරණි අපවිත්‍ර ලෝකයේ බොහෝ අපද්‍රව්‍ය ඇත. ඒ සෑම දෙයක්ම දැනුමේ යාග ගින්නේ බිලි වෙයි. ඔවුන් අඛණ්ඩව විවිධ මාදිලියේ බෝම්බ නිපදවයි. ඒවා හෙලූ විට, ගිණි දැල් බවට පිපිරෙන බෝම්බ ඔවුන්ට තිබේ. සියල්ල අසීමිත ලෙස විනාශ කළ හැකි, එවන් පරමාණුක ද්‍රව්‍ය ඔවුන් ඒවා තුළට දමයි. කිසිවෙකුට ප්‍රතිකාර ආදිය ලබාගැනීමට, රෝහල් ආදිය ඉතිරි නොවෙයි. පියා පවසන්නේ දරුවන් කිසිම අපහසුතාවයක් අත් නොවිඳිය යුතුයි. ස්වභාවික ව්‍යසන සහ මොරසූරන වැස්ස තිබුණු බව සිහි කෙරෙන්නේ මේ නිසාය. දරුවන්ට විනාශයේ දර්ශනද ලැබී ඇත. විනාශය නියත වශයෙන්ම සිදුවිය යුතු බව, ඔබගේ බුද්ධියද පවසයි. ඔවුන්ට විනාශයේ දර්ශනයක් ලැබුණු විට පමණක් මෙය විශ්වාස කරන බව, ඇතමුන් පවසයි. හොඳයි, ඔබ එය විශ්වාස නොකරන්නේ නම්, එය ඔබගේ වැඩක්. ඇතමුන් පවසන්නේ, එහි දර්ශනයක් ලැබුණහොත් පමණයි, ඔවුන් ජීවාත්මය ගැන විශ්වාස කරන්නේ කියා. හොඳයි, ජීවාත්මය තිතකි. ඔබ එය වරක් දකින්නේ නම්, ඉන්පසුව? ඔබට ඉන් විමුක්තිය ලැබෙයිද? ඔවුන් පවසන්නේ, පරම ජීවාත්මය, හිරු දහසකට වඩා දීප්තිමත් සදාතනික ආලෝකයක් බවයි. කෙසේවෙතත්, එය එසේ නොවෙයි. අර්ජුන මෙසේ පැවසූ බව, ගීතාවේ ලියා තිබේ මෙය නවත්වන්න. මට එය දරාගත නොහැක. දරුවෙක් තම පියා දැක, ඔහුව දරාගැනීමට නොහැකි බව පැවසීම - එවැනි කිසිවක් විය නොහැක. ජීවයක් කෙබඳුද, පියා, පරම පියා, පරමාත්ම ජීවයද එබඳුය. ඔහු දැනුමේ මහා සාගරය වනවා පමණයි. ඔබටද දැනුම තිබේ. පියා පැමිණ, ඔබට උගන්වයි වෙනත් කිසිවක් නැත. ඔබ කුමන භක්ති හැඟීමකින් කෙනෙක් සිහි කරන්නේද, මා එම භක්තියේ හැඟීම් ඉටු කරලන්නෙමි. එයත් නාටකයේ නියම වී තිබේ. කෙසේවෙතත්, කිසිම කෙනෙකුට දෙවියන්ව ලබාගත නොහැක. මීරාට දර්ශනයක් ලැබුණු විට, ඇය බොහෝ සතුටට පත් වූවාය. ඇගේ මතු භවයේද ඇය බැතිමතෙක් වන්නට ඇති ඇයට පාරාදීසියට යාමට නොහැක. ඔය දරුවන් දැන් පාරාදීසියට යාමට සූදානම් වනවා. ඔබ පාරාදීසියේ, ක්‍රිෂ්ණාගේ දේශයේ, අධිපතියන් වන බව ඔබ දන්නවා. මෙහි සෑම කෙනෙක්ම අපායේ අධිපතියන්ය. ඉතිහාසය සහ භූගෝලය නැවත වරක් ඒ අයුරින්ම සිදුවෙයි. ඔබ නැවත වරක් ඔබගේ රාජධානියේ භාග්‍යය හිමි කරගන්නා බව, ඔය දරුවන් දන්නවා. මෙය රාජයෝගාවේ බලයයි. භෞතික බලයෙන් බොහෝ වාර ගණනාවක් බොහෝ උපත්වල යුද්ධ හටගෙන තිබේ. යෝගා බලයෙන් ඔබට ඉහළ නැඟීමේ ස්ථිතිය තිබේ. දිව්‍ය ලෝකයේ ආධිපත්‍යය, ස්ථාපිත වන බව ඔබ දන්නවා. පෙර චක්‍රයේ උත්සාහ දැරූ අය, නැවතත් එසේ කරයි. ඔබට හෘදයාබාධ ඇති නොවිය යුතුයි. ඔවුන්ගේ බුද්ධියේ ස්ථිර විශ්වාසය ඇති අයට, කිසි විටෙක සැකයන් ඇති විය නොහැක. සැක සහිත බුද්ධි ඇති අය අනිවාර්යෙන්ම සිටියි. බාබා ඔබට පවසා තිබෙන්නේ මෙම දැනුම ඇසූ විට විශ්මයට පත් වී, ඉන්පසුව පැන යන අය සිටියි. අහෝ මායා! ඔබ ඔවුන්ව දමනය කරයි! මායා බොහෝ බලවත්ය. ඉතා හොඳ අංක එකේ සේවය කරන සහ මධ්‍යස්ථාන පවත්වාගෙන යන අයට පවා, මායා පහර දෙයි. ඇතමුන් ලියන්නේ බාබා, මා විවාහ වී, මගේ මුහුණ කිලිටි කරගත්තා. රාගයේ අසිපතෙන් මා පරාජය වුණා. බාබා, ඔබ ඉදිරියට පැමිණීමට මා දැන් සුදුසු නැහැ. පසුව ඔවුන් ලියන්නේ බාබා, මට ඔබ ඉදිරියට පැමිණිය හැකිද? එවිට බාබා පෙරලා ලියන්නේ ඔබ කොහේ සිටියත් උත්සාහ දරන්න. ඔබ වරක් වැටෙන්නේ නම්, ඇද වැටෙයි. ඔබට රාජකීය තත්ත්වයක් හිමි කරගැනීමට නොහැකි වෙයි. මෙවැනි කියමනකි ඉහළ නඟින අය, දිව්‍ය ලෝකයේ මිහිරියාව රස විඳින අතර, ඇද වැටෙන අය, සොහොන් පල්ලන් වෙයි. ඔවුන් පස්වැනි මහලෙන් වැටෙන විට, ඔවුන්ගේ සියලුම අස්ථි බිඳී යයි. එවිට සමහරුන් ඇත්ත ලියන නමුත්, ඇතමුන් බාබාට කියන්නේවත් නැහැ. එහි නිදසුනක් වන්නේ, ඉන්ද්‍රාගේ සභාවේ සුරංගනාවගේ කතාපුවතයි. මේ සියල්ල දැනුම පිළිබඳ කාරණය. කිසිම අපවිත්‍ර මනුෂ්‍යයෙකුට මෙම සමූහයේ අසුන් ගැනීමට අයිතියක් නැත, නමුත් සමහර අවස්ථාවන්හිදී, ඔවුන්ට මෙහි අසුන්ගැනීමට අවසර දීමට සිදුවනවා. ඇත්ත වශයෙන්, අපවිත්‍ර අය පමණයි මෙහි පැමිණෙන්නේ. බලන්න, ද්‍රෞපදීලා කී දෙනෙක් දැන් අඬ ගසනවාද කියා, 'බාබා, අපව නිරුවත් කිරීමෙන් බේරාගන්න!' බන්දන වල සිටින අයටද චරිත කොටස් තිබේ. තවමත් රාගයෙන් පිරී සහ කෝපයෙන් යුත් අය සිටියි බොහෝ ගැටුම් තිබේ. බාබාට සියලු තොරතුරු ලැබෙයි. අසීමිත පියා පවසන්නේ දරුවනේ, මෙය දමනය කරන්න! දැන් පාරිශුද්ධ වන්න! මා සිහි කරන්න, එවිට ඔබ ලෝකයේ අධිපතියන් වීම සහතිකයකි. ඔවුන්ම (බෝම්බ නිපදවන අය) පුවත්පත් වල මෙසේ පල කරයි මේ සියලු දේ නිදපවන්න අපව දිරිගන්වන කෙනෙක් සිටිනවා. එම දේ වලින් ඔවුන් තමන්ගේම වර්ගයේ අය, විනාශ කර දමයි. කෙසේවෙතත්, එය නාටකයේ නියම වී ඇත්නම් ඔබ කුමක් කරන්නද? දිනෙන් දින, ඒවා නිපදවීම ඔවුන් අඛණ්ඩව සිදු කරගෙන යයි. වැඩි කාලයක් ඉතිරි වී නැත. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ආදරණීය, ස්වර්ණමය යුග රාජධානියට යාම සඳහා, බොහෝ සේ ආදරණීය වන්න. රාජකීය තත්ත්වයක් හිමි කරගැනීම සඳහා, ඔබ නියත වශයෙන්ම පාරිශුද්ධ විය යුතුයි. පළමුවැන්න, පාරිශුද්ධත්වයයි, විශාලතම සතුරා වන රාගය ඔබ පරාජය කළ යුත්තේ මේ නිසාය.
2. මෙම පැරණි ලෝකයේ අසීමිත නිරාශාව ඇති කරගැනීම සඳහා, ඔබගේ සිරුර ඇතුළුව, ඔබගේ දෑසින් දකින සෑම දෙයක්ම දැක, නොදකින්න. සෑම පියවරකදීම පියාගෙන් අවවාද ලබාගන්න.

**වරදානය:** සැබෑ තපස්විවරයෙකු සහ සේවාදායකයකු ලෙස, මුළු වෘක්ෂය පිළිබඳ ඥානය ඔබේ සිහිය තුළ රඳවා ගනිමින් ඔබ තපසා්‍යාව කරත්වා.
භක්ති මාර්ගයේදී, ගසක් යට හිඳගෙන තපස් රකින තපස්විවරයෙකු නිරූපණය කෙරේ. එහි ද වැදගත්කමක් ඇත. ඔය දරුවන් ලෝකයේ 'කල්ප වෘක්ෂයේ' මුල් අතර වාසය කරන්නන්ය. ගස යට හිඳගැනීමෙන්, මුළු වෘක්ෂය පිළිබඳ ඥානය ඉබේම ඔබේ බුද්ධිය තුළ පිහිටයි. එබැවින්, මුළු වෘක්ෂය පිළිබඳ ඥානය ඔබේ සිහිය තුළ තබාගෙන, නොබැඳි නිරීක්ෂකයෙකු ලෙස එම වෘක්ෂය දෙස බලන්න. මෙසේ කිරීමෙන් ඔබට ආධ්‍යාත්මික කුල්මත්භාවය සහ සතුට ලැබෙන අතර ඔබේ 'බැටරිය' ද ආරෝපණය වනු ඇත. එවිට, ඔබ සේවය කරන අතරතුරම තපස් රැකීම ද කරනු ඇත.

**පාඨය:** ශරීරයේ ඇතිවන ඕනෑම රෝගයක් විශාල කාරණයක් නොවේ, නමුත් කිසිවිටෙකත් ඔබේ මනස රෝගී වීමට ඉඩ නොදෙන්න.

***** ඔම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් ඔබගේ දානපති ස්වරූපය හෙළිදරව් කරන්න.**

දානපතියාගේ දරුවන් නිරන්තරයෙන්ම සියලු ආකාරයේ සමෘද්ධියෙන් පූර්ණව සිටිති. භක්තිකයෙකුගේ හෝ යාචකයෙකුගේ ස්වභාවයන් කිසිවිටෙකත් මතු නොවිය යුතුය. බාබා ඔබට උදව් කළ යුතුය හෝ ආශිර්වාද දිය යුතුය යන සිතිවිල්ලවත් ඇති කර නොගන්න. "බාබා, මට සහයෝගය අවශ්‍යයි. මට ශක්තිය අවශ්‍යයි" - "මට අවශ්‍යයි..." යන මෙම වචන, දානපතියන්, වාසනාව ලබා දෙන්නන් සහ ආශිර්වාද පිරිනමන්නන් වන දරුවන්ට නොගැලපේ. දානපතියාගේ දරුවන් වන ඔබ, සියලු ශක්තීන්ගෙන් පූර්ණව සිටී. මෙම පූර්ණත්වයේ අවධිය, පරිසමාප්ත අවධිය සමීප කරවනු ඇත.